## සොහොයුරිය....

දැනේ හිතට දුකක්
ඔබ සිහිවන විට
හැමදාම.....
දැනේ හිතට බරක්...
දුරු රටක සිට....
අමතක විට
හැමවිටම
නැතේ... ඔබේ වතේ සිනාවක්..
නැතේ... ඔබේ ගතේ සවියක්..
නැතේ... ඔබේ සිතේ තරහවක්..
ඇයිද සොහොයුරිය...
උරුම වුනේ
ඔබට ....
සදාකල්.....
මෙවන් වේදනාවක්...

**රමණී පෙරේරා**
බන්ඩුරා වික්ටෝරියා

## හද පුදසුන

සබඳ ෟ
මි විතක් බඳු අප ප්‍රේම පුරා වෘතය,
විරාමයකට කැඳවා ඇතත් දැන්,

අතීත සිතුවම් පටල අතරින්,
දෝර ගලනා කඳුළු දහරින්
සවනත වැදෙනා සත්සර වදනින්,
දවයි මා හද කීතු කරමින්,

ඔබ පෙම් කළ මා.......
මා පෙම් කළ ඔබ.....
අද අපටම අහිමි වී ඇත

මා කුල කුමරකු අත ගෙන ඇත
ඔබ කුල කුමරියක් කැඳවා ගෙන ඇත

එහෙත් සබඳ ෟ

සිරුරින් දෙතැනක රඳවා තැබුවත් අප,
ත්‍රිකෝණ ප්‍රේමයෙන් වෙළුවත් හද අප,
සාගර රැල්ලෙන් දෙලොවට ආ අපි,
සිහින ලොවේ අපි අපේම වී ඇත....

අනේ සබඳ ෟ

කිසිඳු දිනයක ඔබ පතිනිය මුණ
නොගස්සන්න
ඔබ මට පෙම් කළ බව නොපවසන්න
කිඳුරු කොදෙව්වට රජ කරන්න
ඔබ හද කොණක මා රඳවා තබන්න.....

අහිමි සබඳ ෟ

සිත්තමින් ඔබෙ රුව අඳින්නම්,
සෝ සුසුම් ඔබ වෙත එවන්නම්
සිඳ මඬුල්ලෙන් දෙනුවන් තෙමන්නම්
මියෙන තුරා ''ආදරේ'' කියන්නම් .......

**කාන්ති වික්‍රමසූරිය**

## වීරයෝ

වාසනා ගුණේ ගෙනෙන්න වාසනා බිමේ
වාසනා බිමේ උපන්න පුංචි සාවුනේ
ලොකය පෙරලෙන්න ඇවිත් ...
ඔබේ පහස මට එඩියකි
බලය නැති උනත් අවියකි
බිය නොවන්න තල් අත්තකි
පුංචි සාවුනේ

වීරයන් උපන්න වීරයන් මරා දැමූ
බියසුළුන් නිසාය රැකුනෙ තේජසේ අගේ
උන් එපා අනේ අපට වීරයන් එපා
සාවුනේ කියන්න අපට ගැලවුමේ බලේ

වීරයන්ගෙ මහ කෙටියි
දෙස් පෙමුන් මිලෙන් වැඩියි
සිංහලුන් වෙලා රුදෙන්න තව සහශ්‍රයක්
ඔබේ මහම අපි එනවා නෑ ප්‍රමාදයක්

විකුම්




## හිමි අහිමි

හුදකලා අසපුවේ
දොරකඩින් මෑත් වී
බලා සිටියෙමි දුකින්
මගේ හිත අද්දරින්
ගලන සුදු දිය දහර
ඔබේ මුදු ආදරය
නිමක් නැති දුරක් යන...

**ශ්‍රියා කුමාරසිංහ**
නවසීලන්තය

## හැරදා ගිය පෙම්වතිය

මන්ද නුඹට
ආලෙ කලේ
නුඹේ සිතත්
ඉදිලෙන කොට
ආලවන්ත නුඹේ බහට
සිත නැලවුණා වෙන්න ඇති

මාල වළලු
පාට සේල
නුඹේ ඇසට නොගැටෙන්නට
හිසට සෙවන ගෙන දෙන්නට
අහස් මාලිගා තනන්න

ජීවිතේට එක් නොවුනට
මගේ සිතත් ලත වුණාට
තවත් හොඳට තුරුළුවෙයන්
නුඹේ ගුරුට මටත් හොරෙන්
මතු දිනයක යලි හමුවෙමු
කිසිදා වෙන් නොවන ලෙසින්

නවසීලන්තයේ

## නොපිපි මල

තුන් මසක සිහිනයක් බොඳවුනා
රතු ලෙයින් සිහිවටන
සිත පුරා ඉතිරි කර
නොපිපි මල් පොහොට්ටුව පරවුනා
ජීවිතය නැවතුනා
තෙවන වරටත් ලොවේ කුරිරු බව පසක් කර
ජීවිතය නැවතුනා

රුධිර බි එකින් එක එකතු කර
කුස පුරා කළලයක් සැදුයේ
මේ ලෙසින් ක් සුසුම් හෙලන්නද?
සිහිනයක දුටු බිළි රුව කෙදින
අනේ මා සැබෑ ලොව දකින්නද?
තව කොතෙක් කල් මෙලෙස තැවෙන්නද?
මගේ ඉරනම සදා
කළු බි අතර දිවි ගෙවන්නද?

හෙට දිනේ යලිත් හිරු නැගේදෝ?
අරු මා ලොව මිලින මල් අතර
සුදෝ සු රෝස මල පිපේදෝ?
කළු බි මැකේදෝ?
සුසුම් රැළි නැසේදෝ?
උපදිනා ආත්මෙන් ආත්මෙට
මෙවැනි ක් යලිත් ඇති නොවේදෝ?

**රසිකා පෙරේරා**

## එක්තරා සිදුවීමක්

ජාතිවාදයේ
බිරුසන් හඬ මැද
සමාජවාදය
සැඟවී ගිය සඳ
සහෝදරත්වයෙ
සළු පට ගිලිහිණි
අමානුශිකත්වයෙ
නිරුවත හෙළිවිණි

**ර චන්ද්‍රසූරිය**

# The Challenge

ඔබේ විවේකය විනෝදයෙන් ගත කරන්නට සන්නස ගෙන එන විශේෂාංගයයි මේ. බැලූ බැල්මට මේ රූ සටහන් දෙකම එක සේ ය. නමුත් ඊ රූ සටහන හා රූ සටහන අතර වෙනස් කම් 10 ක් ඇත. ඔබ කළ යුත්තේ ඊ රූ සටහනේ මේ වෙනස්කම් ලකුණු කර අප වෙත එවීමයි. ජයග්‍රාහකයාට සන්නස දුරකථන ඇමතුම්පතක් හිමිවෙයි.







නම ....................................................................
ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න) .............................................................
.............................................................
දුරකථන අංකය .............................

**ගිය මාසයේ ජයග්‍රාහකයා**
**Malini Haris**
**19/90 Harold Street**
**Thornbury 3071**

**මේ අයත් නිවැරදි පිළිතුරු එවා තිබුණා**

**තිස්ස අමරසේකර** Rowille
**පියුමාල් අලහකෝන්** Sydenham
**Dilruk Ranatunge** St Albans Vic
**U S Priyanthi** Dandenong
**Chaminda Gunasekara** G'Waverley
**W T Tharanga Sanjeewa** Brunswick
**Shirmila Jayasundara** Hillsdale NSW
**නෙළුම් කුමාරපතිරණ** නරේවරන් වික්
**Malini Haris** Thornbury Vic
**S D C N Senaratne** Vermont Sth Vic
**Sashika Wickramasinghe** Roxburgh Park Vic
**Kumara Siriwardhana** Preston NSW
**Asitha Jayasekara** ACT
**Sujatha Kumarapathirana** Kew Vic
**අමාලි පෙරේරා** එපින් වික්
විනාලි තෙන්නකෝන් ඩැන්ඩිනොන් වික්

සාදර අනුග්‍රහය
Disney Maintenance
DM
INDUSTRIAL
COMMERCIAL
DOMESTIC
CARPET STEAM CLEANING - HARD FLOOR CLEANING & SEALING
Disney Maintenance
Rohan Tel: 03 9792 0656 Mob: 0408 106 022